# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා ආර්ථිකය 2019 වර්ෂයේ දී සියයට 2.3 කින් වර්ධනය වේ

### ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2019 වර්ෂයේ සිව්වන කාර්තුව සහ 2019 වර්ෂය සඳහා

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk

…………………………………………………………………………………………………………

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 සිව්වන කාර්තුව සහ 2019 වර්ෂය සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශය අනුව පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන පරිදි 2019 වර්ෂය (ජනවාරි- දෙසැම්බර්) සඳහා ඇස්තමේන්තු කර ඇති ආර්ථික වර්ධන වේගය සියයට 2.3 කි. 2019 වර්ෂය සඳහා ස්ථාවර මිල (2010) ගණන් යටතේ ඇස්තමේන්තු කරනු ලැබූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 9,889,379 කි. තව ද 2018 වර්ෂය සඳහා මෙම අගය රුපියල් මිලියන 9,668,600 ක් විය.

ආර්ථිකයේ ප්‍රධාන සංරචක වන කෘෂිකර්මය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකල බදු 2019 වර්ෂයේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය පිළිවෙලින් සියයට 7.4 ක්, සියයට 27.4 ක්, සියයට 58.2 ක් සහ සියයට 6.9 ක් ලෙස වාර්තා වේ.

කර්මාන්ත ආර්ථික කටයුතු 2018 වර්ෂයේ වාර්තා වූ සියයට 1.2 ක වර්ධනයට සාපේක්ෂව 2019 වර්ෂයේ දී සියයට 2.7 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. සේවා අංශයේ ආර්ථික කටයුතු තවදුරටත් සියයට 2.3 කින් වර්ධනය වී ඇත. තව ද කෘෂිකාර්මික ආර්ථික කටයුතු 2018 වර්ෂය සඳහා වාර්තා කළ සියයට 6.5 ක ඉහළ වර්ධනයට සාපේක්ෂව තවදුරටත් සියයට 0.6 කින් වර්ධනය වී ඇත.

## කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන්

කෘෂිකාර්මික ආර්ථික කටයුතු අතුරින් ප්‍රධාන කෘෂිකාර්මික ආර්ථික කටයුතු කිහිපයක්ම 2019 වර්ෂයේ දී පසුබෑසීම් වාර්තා කර ඇත. ඒහිදී “කරදිය ධීවර කටයුතු” සහ “වී වගා කිරීම” පිළිවෙලින් සියයට 5.5ක් සහ සියයට 0.3ක් වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත. තව ද 2019 වර්ෂයේ දී “වී හැර අනෙකුත් ධාන්‍ය වගා කිරීම”, “රබර් වගා කිරීම” , “පැළ බෝ කිරීම” , “දැව හා වන ද්‍රව්‍ය” , “තේ වගා කිරීම”, “කුළුබඩු වගා

කිරීම"  පිළිවෙලින් සියයට 9.5ක්, සියයට 9.5ක්, සියයට 6.3ක්, සියයට 4.8ක්, සියයට 1.3ක් සහ සියයට 1.0ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.  කෙසේ වෙතත් "පොල් වගාව ඇතුළත් තෙල් සහිත බෝග වගාව", "පළතුරු වගා කිරීම, "සත්ව නිෂ්පාදන", "මිරිදිය ධීවර කටයුතු" සහ "එළවළු වගා කිරීම" යන කෘෂිකාර්මික ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 18.2 ක්, සියයට 8.5 ක්, සියයට 3.2ක්, සියයට 3.0ක් සහ සියයට 1.5 ක් වශයෙන් සැලකිය යුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

## කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන්

පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 27.4 ක දායකත්වයක් සපයන කර්මාන්ත ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් 2019 වර්ෂයේ දී  සියයට 2.7ක වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී "නිමැවුම් කර්මාන්ත කටයුතු" වාර්තා කර ඇති වර්ධනය සියයට 1.9 කි. ඒ සදහා "ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන" සහ "රෙදිපිළි, නිමි ඇදුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන" පිළිවෙලින් සියයට 3.4ක් සහ සියයට 3.9ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කරමින් දායක වී ඇත. එසේ ම "පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන", "රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන",  "යන්ත්‍ර සූත්‍ර උපකරණ නිෂ්පාදන" සහ "අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන" පිළිවෙලින් සියයට 23.4 ක්, සියයට 3.9ක්, සියයට 1.0ක් සහ සියයට 0.4ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් 2019 වර්ෂයේ දී  "දැව හා දැවමය නිෂ්පාදන", "රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන", සහ "කඩදාසි නිෂ්පාදන" සහ "මූලික  ලෝහ හා ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදන", යන නිමැවුම් කර්මාන්ත ක්‍රියාකාරකම් පිළිවෙලින් සියයට 7.9 ක්, සියයට 5.8ක්, සියයට 4.4ක් සහ සියයට 3.7 ක් වශයෙන් ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන්  "විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම " සහ "ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම" පිළිවෙලින් සියයට 4.0 ක් සහ සියයට 5.5 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර "පතල් හා කැනීම්" 2019 වර්ෂයේ දී සියයට 2.8 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. මේ අතර දළ දේශීය නිෂ්පාදිතයට කර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් ඉහළම (සියයට 7.5 ) දායකත්වයක් සහිත ඉදිකිරීම් කර්මාන්තය සියයට 4.0 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත.

## සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන්

කෘෂිකාර්මික, කාර්මික සහ සේවා යන ප්‍රධාන ආර්ථික කටයුතු අතුරින්  දළ දේශීය නිෂ්පාදිතයට සියයට 58.2 ක ඉහළම දායකත්වය සපයන සේවා ආර්ථික කටයුතු පෙර වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ දී  සියයට 2.3 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී "විදුලි සංදේශ සේවා", "තොරතුරු තාක්ෂණ සේවා", "රක්ෂණ සේවා", ",  "තොග හා සිල්ලර වෙළදාම් කටයුතු" සහ "අනෙකුත් පෞද්ගලික සේවා" පිළිවෙලින් සියයට 17.2ක්, සියයට 13.1ක්, සියයට 5.8ක්, සියයට 3.0ක් සහ සියයට 2.1ක්  වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් "මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා" 2019  වර්ෂයේ දී සියයට 2.0ක සුළු ධන වර්ධනයක් වාර්තා කර ඇත. තව ද  "ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම" පාස්කු ඉරිදා සිද්ධියේ බලපෑම තවදුරටත් පෙන්නුම් කරමින් සියයට 4.6 ක් වශයෙන් ඍණ වර්ධන වේගයක් වාර්තා කර ඇත.

## 2019 සිව්වන කාර්තුවේ වර්ධනයන්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන පරිදි 2019 සිව්වන කාර්තුව සදහා ඇස්තමේන්තු කර ඇති ආර්ථික වර්ධන වේගය සියයට 2.0 කි. ඒහිදී ස්ථාවර මිල (2010) ගණන් යටතේ ඇස්තමේන්තු කරනු ලැබු ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,737,830 කි. 2019 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා අංශයේ ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 1.4ක් සහ සියයට 2.7ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. 2019 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු පසුගිය වසරේ සිව්වන කාර්තුවට සාපේක්ෂව සියයට 4.1ක පසුබෑමක් වාර්තා කර ඇත.

2019 වර්ෂයේ සිව්වන කාර්තුව සහ 2019 වර්ෂය සදහා අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇති බව දෙපාර්තමේන්තුව පවසයි.

ආචාර්ය අයි. ආර්. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

---